## 2025 - 06 -09 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ.

## විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව.

මෙදින පෙ.ව 10.00 ට විශේෂ මහා සභා රැස්වීම ආරම්භ වු අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා | ගරු සභාපති |
| 02. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 03. | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 08. | ගරු මන්ත්‍රීනි ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සභික |
| 09. | ගරු මන්ත්‍රීනි ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 10. | ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා | සභික |
| 11 | ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 12 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 13 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සභික |
| 14 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභික |
| 15 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිතුමා | සභික |
| 16 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා | සභික |
| 17 | ගරු මන්ත්‍රීනි එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 18 | ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා | සභික |
| 19 | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 20 | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 21 | ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 22 | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 23 | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 24 | ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 25 | ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා | සභික |
| 26 | ගරු මන්ත්‍රීනි ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 27 | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සභික |
| 28 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 29 | ගරු පී.මාලින්ද මුදන්නායක මැතිතුමා | සභික |
| 30 | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 31 | ගරු මන්ත්‍රීනි පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |

01.ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා සභාවේ ලේකම් ලෙස සහභාගී විය:-

**සභාපතිතුමා:-**

පළාත් පාලන ඡන්දයේ දී ඇහැලියගොඩ ප්‍රදේශීය සභාව වෙනුවෙන් කොට්ඨාශ මට්ටමින් තරග කරල එයින් තේරී පත් වුණු සියලුම කියන්න බෑ මොකද සජබ මන්ත්‍රීවරු පස් දෙනා තවම අපට ගැසට් කරල නෑ.ඇත්තටම ඒ ගොල්ලො සිටිය නම් ඇත්තටම හරිම හොඳයි. නමුත් අපි කණගාටු වෙනව තාම ඇවිල්ල

නෑ.ඒ නිසා මේ පැමිණ සිටින සියලු දෙනා ම මම සභාපති හැටියට ඉතා ම ගෞරවයෙන් යුතුව සියලු දෙනා පිළිගනු ලබනවා.

අපි ආරම්භ කිරීමට ප්‍රථමයෙන් තම තමන්ගේ ආගම සිහිකරන මෙන් ආරාධනා කරනවා.

අද කවුරුත් දන්නවා අද අපිට විශේෂ සභා රැස්වීමක් තමයි තියෙන්නේ.අද විශේෂයෙන් ම න්‍යාය පත්‍රයේ තියෙන්නේ මහා සභාවක් සඳහා දින නියම කරන්න.ඒක නිසා මම අපි දන්නවා මේ වර්ෂයේ අපට මාස කීපයයි තියෙන්නේ සංවර්ධන වැඩ කිරීම සඳහා.ඒ හින්දා ළඟ ම දිනයක් දාල තියෙනවා මහා සභා රැස්වීමට.

**01. 2025 වර්ෂයට අදාළව මහා සභා රැස්වීම් සඳහා දින තීරණය කිරීම**

ජුනි මසට අදාළ සාමාන්‍ය මහා සභා රැස්වීම මෙම මස 20 වන දා සිකුරාදා දින උදේ 9.30 ට පවත්වන බවත් ඉන් පසු ජුලි මාසයේ සිට සෑම මසක ම දෙවන සතියේ අඟහරුවාදා දින උදේ 9.30 ට සභාව පැවැත්වෙන බවත් මම යොජනා කරමි.

**උප සභාපති මහේෂ් රත්නායක:-**
**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

ඒ අනුව 2025 වර්ෂයට අදාළ මහා සභා රැස්වීම් සඳහා දින තීරණය කිරීම සඳහා විශේෂ මහා සභා අනුමැතිය ලබා ගැනිම වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
විශේෂයෙන් ම සඳහන් කරන්න ඕන ඔයාලට පේනවා ඇති තමන්ගේ ෂීට් එක ඉස්සරහ තියෙන මයික් තව කීපදෙනෙකුට අඩුයි.ඒ ටික අපට ගන්න වෙන්නේ හැකි ඉක්මනින් ම සභාවෙන් ම සම්මත කරල ඒක ගමු.එ◌ුක නිසා කාටහරි අපහසුවක් තියෙනව නම් මේ වෙලාවේ ඒකට සමා වෙන්න.

ඒ වගේම පේනවා ඇති,මීට ඉස්සෙල්ල මන්ත්‍රීවරු දන්නව ඇති මේ සභාව අපි වෙනස් කරල තියෙනවා.මාධ්‍ය සහෝදරයින් සඳහා අපි වැඩි ඉඩ කොටසක් වෙන් කරා.ඒ වගේ ම මහජනතාවගේ ගැලරියේ සිට බලන්න පුළුවන් විදිහට අපි වැඩි ඉඩ කොටසක් වෙන් කරල තියෙනවා.

එහෙනම් අද තියෙන්නේ ඉදිරි කමිටු හතරයි, උපදේශක කමිටුවත් එක්ක කමිටු පහක්. ඒ සඳහා මං ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා ඒ කමිටු සඳහා නියෝජිතයින් පත් කරන ලෙස.

**02.කමිටු පත් කිරීම**.
**සභාපතිතුමා:-**
ප්‍රථමයෙන් ම නියෙන්නේ මුදල් කමිටුව.මුදල් කමිටුව මෙහෙමයි වෙන්නේ.

**i.මුදල් කමිටුව :-**ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ අරමුදල් හා සම්බන්ධයෙන් ආදායම්, වියදම් හා ප්‍රසම්පාදනය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාව සඳහා 07 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යන්නත් සභාවට යෝජනා කරමි.

**සභාපතිතුමා:-**ගරු සභාපතිතුමනි අපි දැනගන්න කැමතියි ඔබතුමාගෙන් අපි කොහොමද මේ සංයුතිය ඔබතුමා සුදානම් කරල තියෙන්නේ මුදල් කමිටුව සඳහා.

**සභාපතිතුමා:-**
මුදල් කමිටුව සඳහා සංයුතිය මම යොජනා කරන්නේ මගේ දකුණු අත පැතේත සිටින අයගෙන් හතර දෙනෙකුත් හා මගේ වම් අත පැත්තෙන් සිටින අයගෙන් තුන් දනෙකුත් සමන්විතව කමිටුව යෝජනා කරන ලෙස තමා මං ඉල්ලා සිටින්නේ.

**සභික ජී.එච්.සුජීව විජේසුරිය මැතිතුමා:-**
සභාපතිතුමා බොහොමත්ම ස්තුතියි.

**සභික එච්. ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි මුදල් කමිටුව වෙනුවෙන් මම හතර දෙනෙක් යෝජනා කරනවා.ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා,ගරු උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා,ගරු මන්ත්‍රිනී රණවීර හේවගේ මැතිතුමා,ගරු මන්ත්‍රී සමන්සිරි විජේසිංහ මැතිතුමා,මෙහි සභාපති ලෙස ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා මං යෝජනා කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මේ පැත්තෙන් ගරු දිලින් කරුණාපාල මන්ත්‍රීතුමා,ගරු සුජීව විජේසූරිය මන්ත්‍රීතුමා,ගරු වත්සලා නිශාන්ති ධනරත්න මන්ත්‍රීනි.

**සභික එච්.එස්.ලසිත දීපල් මැතිතුමා:-**
ඒ සියලු යෝජනා මං ස්ථිර කරනවා.

ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුව පහත සභික මන්ත්‍රීවරුන්/ වරියන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| 01 | ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා | සභාපති |
| 02 | ගරු.උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | සාමාජික |
| 03 | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සාමාජික |
| 04 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සාමාජික |
| 05 | ගරු මන්ත්‍රී දිලින් කරුණාපාල මැතිතුමා | සාමාජික |
| 06 | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සාමාජික |
| 07 | ගරු මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සාමාජික |

**සභාපතිතුමා:-**
ඒ වගේම සියලු මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් මං අය ද සිටිනවා,අපේ පළමු සභා සැසිය නිසා මෙතන වාර්තා කරන නිලධාරින්ට සහය වීම සඳහා තමන්ගේ යෝජනා ස්ථිර කරන කොට තමන්ගේ නම සඳහන් කරොත් හොඳයි කියලා මම හිතනවා.

**සභාපතිතුමා:-**
බොහොමත්ම ස්තුතියි.
ඊට පස්සේ අපට තියෙනවා දෙවන කමිටුව,මේක කාර්මික සේවා කමිටුව.

II.**කාර්මික සේවා කමිටුව:-** ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්මික සේවා කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ භෞතික හා ආර්ථික සංවර්ධනය,යටිතල පහසුකම් හා නඩත්තු කටයුතු පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාව 07 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යන්නත් සභාවට යෝජනා කරමි.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි කාර්මික සේවා කමිටුව සඳහා මං නම් හතරක් අපේ මන්ත්‍රීතුමන්ලාගෙන් යෝජනා කරනවා.පළවෙනි නම හැටියට ගරු නදුන් විජේසිංහ මැතිතුමාත්,ගරු අමිල් බංණ්ඩාර මැතිතුමාත්,ගරු වජිර ජයසෝම මැතිතුමාත්,ගරු මන්ත්‍රීනී නිරෝෂිකා කුසුම්සිරි මහත්මියත්,යෝජනා කරමි.එහි කාර්මික සේවා කමිටුවේ සභාපති ලෙස ගරු මන්ත්‍රී නදුන් විජේසිංහ මැතිතුමා යෝජනා කරනවා

**සභාපති තුමා:-**
තව තුන් දෙනෙක්

**සභික වත්සලා නිශාන්ති ධනරත්න මන්ත්‍රී තුමිය :-**
ගරු සභාපති තුමනි කාර්මින සේවා කමිටුව සඳහා තුෂාර චන්දන අතුරලිය මහතාත් මාලින්ද මුදන්නායක මහතාත් ඒ. එස් .එම්. මිස්බාහ් මහතාත් යෝජනා කරනවා .

**සභික ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා:-**
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව කාර්මික සේවා කමිටුව පහත සභික මන්ත්‍රීවරුන්/ වරියන්ගෙන් සමන්විත විය

| | | |
|---|---|---|
| 01 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා | සභාපති |
| 02 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා | සාමාජික |
| 03 | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සාමාජික |
| 04 | ගරු මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සාමාජික |
| 05 | ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා | සාමාජික |
| 06 | ගරු පී.මාලින්ද මුදන්නායක මැතිතුමා | සාමාජික |
| 07 | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සාමාජික |

**සභාපතිතුමා :-**
බොහෝම ස්තුතියි.මීළඟ කමිටුව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව.

III. **නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව:-** ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාව 07 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යන්නත් සභාවට යෝජනා කරමි.

**සභික අමල් නිමේෂ මැතිතුමා:-**
ගරු මූලාසන සභාපති තුමා අවසරයි නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ හත් දෙනෙකුගෙන් සමන්විත කමිටුව සඳහා මං යෝජනා කරනවා ගරු මන්තිර් ආරියදාස මැතිතුමා, ගරු මන්ත්‍රිනි සුමිත්‍රා සේනානායක මැතිණිය, ගරු මන්ත්‍රී මොහොමඩ් මුන්සීර් මැතිතුමා ,ගරු මන්ත්‍රී සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා මෙම කමිටුවේ සභාපති ලෙස ආරියදාස මැතිතුමා මං යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි වම් පැත්තෙ කණ්ඩායම වෙනුවෙන් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව වෙනුවෙන් ගරු මන්ත්‍රී සුමිත් ප්‍රියංකර මැතිතුමා ගරු මන්ත්‍රිනි වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය ඒ වගේම ගරු මන්ත්‍රිනී ක්‍රිෂ්ණා දිල්රුක්ෂි මැතිතුමිය අපේ කණ්ඩායම වෙනුවෙන් යෝජනා කරනවා.

**සභික ඒ.එස් .එම්. මිස්බාන් මැතිතුමා:-**
ගරු සභාපති තුමනි මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව පහත සභික මන්ත්‍රීවරුන්/ වරියන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| 01 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභාපති |
| 02 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සාමාජික |
| 03 | ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සාමාජික |
| 04 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිතුමා | සාමාජික |
| 05 | ගරු මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සාමාජික |
| 06 | ගරු මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සාමාජික |
| 07 | ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සාමාජික |

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපති තුමනි මම ඔබ තුමාගෙන් දැන ගන්න කැමතියි ඔබ තුමාගේ මේ යෝජනා සැලැස්ම අනුව දකුණුපසින් ඒ යෝජනා ස්ථිර කරන කොට සභාපති වරයෙකුත් නම් කරනවා කමිටුවෙ.ඒ අවස්ථාව අපේ වම් පස කණ්ඩායමටත් ඔබ තුමා යෝජනා කරලා තියෙනවද කොහොමද කියලා දැන ගන්න කැමතියි.

**සභාපතිතුමා:-**

අපි යෝජනා කරලා තියෙන්නෙ දකුණුපස සිටින මන්ත්‍රී කණ්ඩායමෙන් තමයි. සභාපති ධූරය සඳහා නම් කළේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා :-**
ගරු සභාපති තුමනි අපි මේ වැඩ සටහන පටන් ගත්ත අද දවසේ ඉඳන් ම ඔබ තුමන්ලගෙ වැඩ පිළිවෙළත් එක්ක අනුගත වෙලා අපි බොහොම නිවැරදිව හරි දේට නිවැරදිව දායකත්වය ලබා දීම තමයි අපි සියළු දෙනාම සාකච්ඡා කරලා තියෙන්නෙ . මං ඔබ තුමාට යෝජනාවක් / අදහසක් ඉදිරිපත් කරනවා අන්‍යෝන්‍ය අවබෝධය ඒ අපේ තියෙන බැඳියාව ඉස්සරහට ගෙනියන්න ඒ යම් යෝජනාවක් තියෙනවා නම් තව කමිටු දෙකයි අපට තියෙන්නෙ ඒ කමිටු දෙකේ අපේ සහෝදරයින්ට අවස්ථාව දෙන්න කියලා මං ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ තුලින් අපේ අන්‍යෝන්‍ය සහයෝගයට වැදගත් වෙයි කියලා.

**සභාපතිතුමා :-**
හොඳයි.ඒක ගැටළුවක් නෑ.
මී ළඟ කමිටුව පරිසර හා පහසුකම් කමිටුව.

IV. **පරිසර හා පහසුකම් කමිටුව:-** ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා පරිසර හා පහසුකම් කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාවට 07 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යන්නත් සභාවට යෝජනා කරමි.

**සභික ඩබ්ලිව් සමන්සිරි විජේසිංහ මැතිතුමා :-**
ගරු සභාපතිතුමාගේ මුලාසනයෙන් අවසරයි.පරිසර හා පහසුකම් කමිටුව සඳහා මා යෝජනා කරනවා ගරු උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා,ගරු මන්ත්‍රී ඩිල්ශාන් කාවින්ද මැතිතුමා,ගරු මන්ත්‍රිනි ගයනී දේවේන්ද්‍ර මන්ත්‍රිනි,ගරු මන්ත්‍රී මොහොමඩ් මුන්සීර් මැතිතුමා,මම යෝජනා කරනවා.

**සභික ගයේෂන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
පරිසර හා පහසුකම් කමිටුව සඳහා අපි යෝජනා කරනවා මාලින්ද මුදන්නායක මන්ත්‍රීතුමා,ගරු ලසිත දීපාල් මන්ත්‍රීතුමා,ගරු නෙල්සන් ජයසේකර මන්ත්‍රීතුමා,ගරු මාලින්ද මුදන්නායකමන්ත්‍රීතුමා එම කණ්ඩායමේ සභාපති ධූරය සඳහා යෝජනා කරමි.

**සභික ක්‍රිෂ්ණා දිල්රුක්ෂි මන්ත්‍රිනි:-**
පරිසර හා පහසුකම් කමිටුවේ ඒ යෝජනාව ස්ථිර කරනවා.

අනුව පරිසර හා පහසුකම් කමිටුව පහත සභික මන්ත්‍රීවරුන්/ වරියන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| 01 | ගරු පී.මාලින්ද මුදන්නායක මැතිතුමා | සභාපති |
| 02 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සාමාජික |
| 03 | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සාමාජික |
| 04 | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | සාමාජික |
| 05 | ගරු මන්ත්‍රී පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා | සාමාජික |
| 06 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සාමාජික |
| 07 | ගරු මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සාමාජික |

**සභාපතිතුමා:-**
මීළඟට අපට තියෙන්නේ අවසාන කමිටුව.උපදේශන කමිටුව.

V. **උපදේශක කමිටුව:-** ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ විශේෂ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා උපදේශක කමිටුවක් පත් කර ගැනීමට යෝජනා කරමි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශේෂ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා උපදේශක කමිටුව වෙනුවෙන් නම් 11 කින් යුතු නම් යෝජනා කරනවා.එහිදී විශ්‍රාමික පාඨශාලාචාර්ය ගාමිණී හෙට්ටිආරච්චි මහතා,ජ්‍යෝෂ්ඨ කළමණාකරණ නිශ්ශංක ධනසිංහ මහතා,ඒ වගේම ඉංජිනේරු ධුරංග සඳරුවන් මහතා, ඒ වගේම ඉංජිනේරු රෝහණ රාජපක්ෂ මහතා, ඒ වගේම අපේ ඇහැලියගොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේඅපේ ගරු ස්වාමීන් වහන්සේ වන කල්‍යාණී ධම්ම හිමියන්, ඒ වගේම අඹන්ඔළුව රජමහා විහාරාධිපති අපේ රත්නාපිටියේ පියදස්සී ස්වාමීන් වහන්සේ, ඒ වගේම රාජ්‍ය සේවක රංජිත් මහතාත්, ඒ වගේම රාජ්‍ය සේවක යූ.කරුණාරත්න මැතිතුමා, ඒ වගේම කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ හිටපු කුමාරත්න මැතිතුමා, ඒ වගේම පාඨශාලාචාර්ය එම්.එම්.ඒ.හිල්මාන් මහතා, සඳරුවන් රාජපක්ෂ මහතා.මං යෝජනා කරනවා.

**සභික ජී.එච්.සුජීව විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි උපදේශක කමිටුව කියන්නේ අපේ ඉදිරි වසර හතර සඳහා ම අපට උපදෙස් දෙන අපේ කමිටුවක්.අපේ ගරු උප සභාපතිතුමන් යෝජනා කරපු විදියට අපි දන්නවා අපේ ප්‍රදේශයේ අපේ විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා පූජක තුමන්ලා සම්බන්ධ කර ගත්තා. කන්තලේ ස්වාමීන් වහන්සේ අපි කවුරුත් දන්නවා.අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයෙක් විදිහට අප ප්‍රදේශයේ සෑම කටයුත්තකටම නායකත්වය දෙන ස්වාමීන් වහන්සේගේ නමක්.මං උන්වහන්සේගේ නමත් යෝජනා කරනවා.ඒ වගේ ම සේකර රණසිංහ මහත්මා,එතුමා ඉංජිනේරුවරයෙක් විදහට අපේ සභාපති තුමා ද දන්නවා.එම්.එම්.තිලක් රාජපක්ෂ මැතිතුමා අපේ හිටපු සිංහ සමාජයේ හිටපු සභාපතිතුමා,මැණික් වෙළෙඳ ව්‍යාපාර සංගමයේ සභාපතිතුමා,මෙහිදී දේශපාලන භේදයක් බලන් නැතුව දාල තියෙන්නේ.ප්‍රියන්ත කුමාර සිංහආරච්චි මැතිතුමා අපේ නීතිඥ මහත්මයා.

**සභික වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**

ගරු සභාපතිතුමා මං ඒ යොජනාව ස්ථිර කරනවා.

ඒ අනුව 2025 උපදේශන කමිටුව පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| 01 | විශ්‍රාමික පාඨශාලාචාර්ය ගාමිණී හෙට්ටිආරච්චි මහතා |
| 02 | ජ්‍යෝෂ්ඨ කළමණාකරණ අසංක ධනසිංහ මහතා |
| 03 | ඉංජිනේරු ධුරංග සඳරුවන් මහතා |
| 04 | ඉංජිනේරු රෝහණ රාජපක්ෂ මහතා |
| 05 | ඇහැලියගොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ ගරු ස්වාමීන් වහන්සේ වන කල්‍යාණී ධම්ම හිමියන් |
| 06 | අඹන්ඔළුව රජමහා විහාරාධිපති හත්නාපිටියේ පියදස්සී ස්වාමීන් වහන්සේ |
| 07 | රාජ්‍ය සේවක රංජිත් තිලකසිරි මහතා |
| 08 | රාජ්‍ය සේවක යූ.කරුණාරත්න මැතිතුමා |
| 09 | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂක කුමාරත්න මැතිතුමා |
| 10 | පාඨශාලාචාර්ය එම්.එම්.ඒ.හිල්මාන් මහතා. |
| 11 | සඳරුවන් රාජපක්ෂ මහතා. |
| 12 | අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂකන්තලේ විජිතවංශ හිමි |
| 13 | ඉංජිනේරු ෂෙල්ටන් රණසිංහ මහතා |
| 14 | සිංහ සමාජයේ හිටපු සභාපති එම්.එම්.තිලක් රාජපක්ෂ මහතා |
| 15 | නීතිඥ ප්‍රියන්ත කුමාර සිංහආරච්චි මහතා |

ඒ අනුව 2025 වර්ෂයට අදාළ කමිටු සඳහා කමිටු සාමාජිකයන් පත් කිරීම සඳහා විශේෂ මහා සභා අනුමැතිය ලබා ගැනිම වු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

සභාපතිතුමා:-

අද දින අපට න්‍යාය පත්‍ර වශයෙන් තියෙන්නේ ,ඊට වඩා යම් දෙයක් කරන්න බෑ.

විශේෂයෙන් මම මේ අවස්ථාව දී පොඩි කරුණක් මතක් කරනවා.මේ මස දොළොස් වෙනිදා පෙ.ව 8.30 සිට 4.30 දක්වා සිට සියලු ම තේරී පත්වුණු,සභා පිහිටවපු ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට තියෙනවා පුහුණු සැසියක්.ඒ සඳහා ඉදිරිපත් වන අය ලිඛිතව දැනුම් දෙන්න.පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානයේ තියෙන්නේ.තමන්ගේ රියදුරක් යනව නම් ඒ අයගෙත් නමත් ලබා දෙන්න.

ඒ වගේ ම අද දින අපි ඕගොල්ලෝ දන්නවා අපි පසුගිය පළාත් පාලන මැතිවරණයේ දී අපි වෙන වෙන ම බල කඳවුරුවලට වෙලා තම තමන්ගේ මතය අපි ජනතාවට ඉදිරිපත් කළා.එකිනෙකා අතර සංවාද විසංවාද තිබුණා,නැතුවා නොවේ. නමුත් මේ වන විට මැතිවරණය අවසානයි.මැතිවරණය ඉවරයි.දැන් මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන්.

දැන් අපි කවුරුත් දන්නවා අපේ රට අපි නිදහස ලබන කොට දකුණු ආසියාවේ බලවත් ම රාජ්‍යක් ම නමුත් මේ වන විට පසුගිය සියවසේ දී අපේ පිටිපස්සෙන් සිටි රාජ්‍යයන් අපිව පසු කරගෙන ඉදිරියට ගියා.එහෙම නම් අපිට දැන් තියෙනවා.දැන් දේශපාලන නේද, ඡන්ද අවසානයි.අවුරුදු හතරක් අපි දිවුරා පොරොන්දු වෙලා තියෙනවා.

ඉතින් මං ඔයගොල්ලෝ සියලු දෙනාගෙන් අපේ කණ්ඩායම,මගේ කණ්ඩායම,ප්‍රාදේශීය සභාවේ කණ්ඩායම ඇත්තට ම සබජ මන්ත්‍රීවරු පස් දෙනාත් සිටිය නම් ඉතාමත් හොඳයි.අපට කාරක සභා වලට දාන්න තිබුණා.නමුත් ඒ ගොල්ලො පසුව අපිත් එක්ක එකතු වෙයි.මම මේ ඉල්ලා සිටින්නේ අපේ මේ රටක් වශයෙන් අපි පසුගාමී රාජ්‍යක්.අපට අවශ්‍යයි අපි සියලුදෙනාගේම හදවත් තුළ තියෙන හැමෝගෙම මෙන්න මේ රට දශක කීපයක් ඈතුළත ඉදිරියට ගෙන යමු.එහි දී අපේ රටේ දැන් තියෙන තත්ත්වය අනුව බැලුවත් ඇහැලියගොඩ තියෙන්නේ ඔයගොල්ලන්ට අපට විවාදයක් නෑ අනෙක් ආසන එක්ක ,අනෙක් නගර එක්ක,අනෙක් සභා එක්ක,බලන කොට ගොඩක් පසුගාමීත්වයෙන් තියෙන්නේ.ඒක නිසා අපි හැමෝටම යුතුකමක් තියෙනවා අපි මෙතනට ජනතාව අපේ ගමේ ,අපේ ගමේ මිනිස්සු අපිව පත් කරල එවල තියෙන්නේ මෙන්න මේ ඇහැලියගොඩ සභාවත් ඇහැලියගොඩ නගරයත්,මේ දැන් තියෙන තත්ත්වයෙන් ඔබ්බට ගෙනියන්න.මෙහි දී අපි හැමෝටම ලොකු කාර්ය භාර්යක් තියෙනවා අපේ ගමේ අපි දන්න කියන මිනිස්සු ජනතාව දූවා දරුවෝ,ඒ හින්දා ලොකු වගකීමක් තියෙනවා මෙන්න මේ ඇහැලිගොඩ නගරයත් ඇහැලියගොඩ සභාවවත් අපිට අනෙක් සභාවන්ට සමගාමීව අපිට ඉදිරියට ගෙනියන්න.ඒ සංවර්ධන කටයුතු අපට ඉක්මනින් කර ගන්න.අපි හැම මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරියන්ට තමන්ට තියෙන අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්.අපිට ඕන මෙන්න මේ ඇහැලියගොඩ ඉදිරියට ගෙනියන්න.ඒකේ සතුට අපි හැමෝටම තියෙනවා.ඒ ආත්ම තෘප්තිය,ඇත්තටම අපට තියෙන්නේ මේ ආත්ම තෘප්තිය අපි දේශපාලඥයන් වශයෙන්.

ඉතින් මම සියලු දෙනාගෙන් ම ඉතා ම ඔනෑ කමින් ඉල්ලා සිටිනවා අපිත් එක්ක එකට වැඩ කරමු.ඕනම ප්‍රශ්නයක් අපිත් එක්ක එකට කතා කරමු.අපි අතර කිසිම මතභේදයක් තිබුණත් දැන් ඒවා ඉවරයි.අපේ හැමෝගෙම සිත් තුල තියෙන්න ඕනේ මේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව එකතු වෙලා මේක අපි දියුණු කරමු,අපි ඉස්සරහට ගෙනි යමු.මං සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මන්ත්‍රීවරියන්ගෙන් ඉතාමත් ම ආදරයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් ඉල්ලා සිටිනවා.

එහෙම නම් අද න්‍යාය පත්‍රානුකූව අපට තියෙන්නේ මේ කමිටු ටික පත් කර ගන්න තමා.ඒ වගේම ඊළඟ සභාව සඳහා දින නියම කරගන්න.

විශේෂයෙන් ම මේ අවස්ථාවේ දී මං ස්තුති වන්ත වෙනවා අපේ සභාවේ අපි ඉදල නෑ.ඔව්, සභාපතිතුමෙක් ඉදල නෑ.2023 න් පස්සේ මේ සභාව ගෙන ගිය ලේකම්තුමා ඇතුළු ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයට මං ස්තුතිවන්ත වෙනවා.

ඒ වගේ ම අද දින අපේ මේ මංගල විශේෂ සැසිය ආවරණය කිරීමට පැමිණ සිටින මාධ්‍යවේදීන්ට බොහොමත් ම ස්තුතියි.අද සභාවේ වැඩ කටයුතු මෙයින් නවත්වමි.දැන් වේලාව පෙ.ව.10.22 යි.

බන්දුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ….............. මස.............දින
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.............